# කාර්ය සාධන වාර්තාව 2018
# செயல் நிறைவேற்ற அறிக்கை 2018
# Performance Report 2018

තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය

அஞ்சல் சேவைகள் மற்றும் முஸ்லிம் சமய விவகாரங்கள் அமைச்சு

Ministry of Postal Services and Muslim Religious Affairs

# කාර්ය සාධන වාර්තාව - 2018

## තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය

තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය
6 සහ 7 වන මහල
තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල
310, ඩී. ආර්. විජේවර්ධන මාවත
කොළඹ 10

# පටුන

පිටු අංකය


- ❖ හැඳින්වීම 1 - 3
- ❖ ආයතන හා පාලන කටයුතු 4 - 9
- ❖ සංවර්ධන සහ සැලසුම් කටයුතු 10 -16
- ❖ මුස්ලිම් ආගමික කටයුතු 17 -20
- ❖ අභ්‍යන්තර විගණන කටයුතු 20
- ❖ මූල්‍ය කටයුතු 21-22
  - ❖ ඇමුණුම 01 - සංවිධාන ව්‍යූහය
  - ❖ ඇමුණුම 02 - කාර්ය මණ්ඩල විස්තරය
  - ❖ Ministry in Action - Photos

# තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය

## හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2103/33 හා 2018.12.28 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් පරිදි තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය පිහිටුවා ඇත.

එමගින් දක්වා ඇති පරිදි, මෙම අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතන පහතින් දැක්වේ.

- තැපැල් දෙපාර්තමේන්තුව
- මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

මෙම අමාත්‍යාංශය මීට පෙර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2096/68 හා 2018.11.09 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය නමින් පිහිටුවන ලද අතර තැපැල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් සහ ආශ්‍රිත ආයතන සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව මෙම අමාත්‍යාංශය යටතේ විය.

ඉහතින් සඳහන් පරිදි තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය පිහිටුවීමට පෙර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/13 හා 2015.09.21 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් පරිදි මෙම අමාත්‍යාංශය තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය නමින් පිහිටුවා තිබුණි. තැපැල් දෙපාර්තමේන්තුව හා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

ඒ අනුව වර්තමානයේ මෙම අමාත්‍යාංශය තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය ලෙස හැඳින්වෙන අතර එහි දැක්ම, මෙහෙවර, ක්‍රියාත්මක කළ යුතු නීති, අරමුණු සහ කාර්යභාරය පහතින් දැක්වේ.

## දැක්ම

විශිෂ්ට හා කාර්යක්ෂම තැපැල් සේවාවක් සහ ඉස්ලාමීය ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය

## මෙහෙවර

විශ්වාසනීය, උසස් ගුණාත්මක බවින් යුත් තැපැල් සේවාවක් දැරිය හැකි මිලකට ජනතාවට ලබාදීම සහ ශ්‍රී ලාංකීය මුස්ලිම් ජන සමාජයේ ආගමික හා සංස්කෘතික කටයුතු වැඩි දියුණු කිරීම උදෙසා පහසුකම් සැපයීම

## ක්‍රියාත්මක කළ යුතු නීති

1. මුද්දර ආඥා පනත (1909 අංක 22)
2. තැපැල් කාර්යාල ආඥා පනත (1908 අංක 11)
3. මුස්ලිම් පල්ලි සහ මුස්ලිම් පුණ්‍යාධාර භාරයන් හෝ වකුෆ් පනත (1956 අංක 51)

## අරමුණු

1. තැපැල් දෙපාර්තමේන්තුවේ සහ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය
2. පිරිවැය අවම කරමින් මහජනතාවට වඩාත් ලාභදායී කාර්යක්ෂම හා සුහදශීලී තැපැල් සේවාවක් සැපයීම
3. නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් ගෝලීය ප්‍රවණතාවයන්ට ගැලපෙන පරිදි තැපැල් සේවාවන් නවීකරණය කරමින් ව්‍යාප්ත කිරීම
4. තැපැල් සේවාවන්හි ගුණාත්මක බව, ප්‍රමිතිය සහ ප්‍රවර්ධනය සහතික කිරීම
5. දේශීය තැපැල් සන්නිවේදන සේවාවට සමගාමී ලෙස මූල්‍ය සේවා පහසුකම් ග්‍රාමීය මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම
6. නියෝජිත සේවා සැපයීමේ පරාසය පුළුල් කරමින් තැපැල් කාර්යාලය ජන ජීවිතයට අදාළ බහුකාර්ය සේවා සැපයීම් ඒකකයක් ලෙස සවිබල ගැන්වීම
7. අනුමත මුද්දර ප්‍රතිපත්තියට අනුව කටයුතු කිරීම
8. සමරු මුද්දර හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නිර්මාණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය හා අභිමානය ජාත්‍යන්තර තලයට රැගෙන යාම
9. විශ්ව තැපැල් සංගමයේ සාමාජික රටක් වශයෙන් එහි නියාමනයට අනුකූලව ශ්‍රී ලංකාවේ තැපැල් සේවාව අන්තර් ජාතික ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි ජාත්‍යන්තර තැපැල් සේවා ප්‍රවර්ධනය
10. මුස්ලිම් පල්ලි, ඉස්ලාමීය ආගමික ආයතන හා පුණ්‍යාධාර අරමුදල් හා ඒවායේ වත්කම් පාලනය
11. ඉස්ලාමීය ආගමික අධ්‍යාපනය සහ ඉස්ලාමීය සංස්කෘතික අංශ, පෝෂණය හා වර්ධනය කිරීම
12. සෑම ඉස්ලාම් භක්තිකයකුටම එක් වරක් හෝ හජ් වන්දනාවේ යෙදීම පිණිස, වඩාත් සාධාරණ වූ ක්‍රමවේදයක් ඇතිකිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීම තහවුරු කිරීම
13. මිලාදුන් නබී උත්සවය අරමුණු කරමින් මුස්ලිම් ආගමික, සංස්කෘතික හා ප්‍රජා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය
14. රාමසාන් උත්සවය සාර්ථකව පැවැත්වීම සඳහා අදාළ සියලු පහසුකම් සැපයීම

## කාර්යභාරය

1. තැපැල් දෙපාර්තමේන්තුවට සහ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට අදාළ රජයේ ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
2. අමාත්‍යාංශය යටතේ ඇති සියලු දෙපාර්තමේන්තු හා ආයතන මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම
3. තැපැල් ක්ෂේත්‍රයෙහි සහ මුස්ලිම් ආගමික කටයුතු සම්බන්ධයෙන් අදාළ විගණන කටයුතු සිදු කිරීම
4. තැපැල් ක්ෂේත්‍රය හා මුස්ලිම් ආගමික කටයුතු සම්බන්ධයෙන්, ජාත්‍යන්තර සංවිධාන සමඟ සබඳතා පවත්වා ගෙන යාම සහ එම සබඳතා වැඩි දියුණු කිරීම

5. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට අනුගතවෙමින් දෙපාර්තමේන්තුවල කළමනාකරණ සහ සියලු මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම
6. ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සමගාමී වෙමින් තැපැල් සේවාවන් පවත්වා ගෙන යාම මෙහෙයවීම
7. අධිවේගී ලිපි, පාර්සල් සේවාවන් සහ සියලුම මූල්‍ය සේවාවන් තැපැල් කාර්යාල පද්ධතිය හරහා ව්‍යාප්ත කිරීම මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම
8. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වය තුළින් කාර්යක්ෂම, ඵලදායී හා ගුණාත්මක තැපැල් සේවාවක් මහජනතාව වෙත ලබාදීමට කටයුතු කිරීම.
9. දේශීය හා විදේශීය මූල්‍ය ආයතන සමග සම්බන්ධීකරණය පවත්වමින්, මූල්‍ය සංසරණ සේවාවන් ප්‍රවර්ධනය කිරීම මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම
10. විශ්ව තැපැල් සංගමයේ හා ආසියා පැසිපික් තැපැල් සංගමයේ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කිරීමේ ප්‍රධාන රාජ්‍ය සම්බන්ධීකාරක ලෙස තැපැල් දෙපාර්තමේන්තුව මෙහෙයවීම හා අධීක්ෂණය
11. තැපැල් හා උප තැපැල් කාර්යාල ජාල පද්ධතිය හරහා මුදල් හුවමාරුව, රක්ෂණ සේවා, බැංකු හා අනෙකුත් මූල්‍ය සේවාවන් ආරම්භ කිරීම හා පවතින නියෝජිත සේවාවන් වැඩිදියුණු කිරීම අධීක්ෂණය කිරීම
12. මුද්දර ප්‍රතිපත්තියට අනුගත වෙමින් දේශිය අවශ්‍යතාවයට ගැලපෙන පරිදි තැපැල් මුද්දර හා ආදායම් මුද්දර නිර්මාණය කිරීම, මුද්‍රණය කිරීම, නිකුත් කිරීම, අලෙවි කිරීම හා තොග පාලනය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීම
13. සමරු මුද්දර හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ගුණාත්මකභාවය සුරක්ෂිත වන පරිදි නිර්මාණය කිරීම,මුද්‍රණය කිරීම, නිකුත් කිරීම හා අලෙවි කිරීම මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම
14. වකුෆ් පනත ක්‍රියාත්මක කිරීම හා වකුෆ් සභාවේ කටයුතු අධීක්ෂණය කිරීම
15. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සහ මිලාදුන් නබි උත්සවය වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලින් වෙන්කර දී ඇති මුදල් මුස්ලිම් ආගමික ආයතන අතර වෙන්කරදීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම
16. රාමසාන් මාසය වෙනුවෙන් විදේශීය මුස්ලිම් රටවලින් ප්‍රදානය කරනු ලබන රටඉඳි සියලුම මුස්ලිම් පවුල් ආවරණය වන පරිදි දිස්ත්‍රික් මට්ටමින් බෙදාහැරීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම
17. හජ් වන්දනාව සම්බන්ධයෙන් සෞදි රජය සමඟ අවශ්‍ය සියලු කටයුතු සම්බන්ධීකරණය, හජ් වන්දනා ක්‍රියාත්මක කරන සංවිධාන තෝරා ගැනීම හා හජ් පංගුව (Quota) විධිමත්ව බෙදාහැරීම, මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම

## 2018.01.01 සිට 2018.12.31 දක්වා කාර්යසාධනය

තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2018.01.01 සිට 2018.12.31 දක්වා ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය මෙම වාර්තාවේ ඇතුළත් කර ඇත.

# තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය

## 01 ආයතන හා පාලන කටයුතු

ආයතන සංවිධාන ව්‍යුහය හා අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ඇමුණුම 1 හා ඇමුණුම 11 හි සඳහන් වේ. මෙම අංශය විසින් ඉටු කරන ලද ප්‍රධාන සංක්ෂිප්ත කාර්යභාරය පහත දැක්වෙන පරිදි වේ.

(1) අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ හා ඒ යටතේ ඇති තැපැල් දෙපාර්තමේන්තු හා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ ආයතන කටයුතු ඉටු කිරීම

(2) අමාත්‍යාංශයේ පාලන කටයුතු මෙහෙයවීම

(3) අමාත්‍යාංශයේ මාධ්‍ය කටයුතු ඉටු කිරීම

(4) පාර්ලිමේන්තු අවශ්‍යතාවලට අදාළ කටයුතු ඉටු කිරීම

### 1.1 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාලය තුළ අමාත්‍යාංශයේ ආයතන අංශයේ කටයුතුවල ප්‍රගතිය

#### 1.1.1 කාර්ය මණ්ඩල ආයතනික කටයුතු

| තනතුරු නාමය/සේවාව | නව තනතුරු ඇති කිරීමට ඉල්ලුම් කිරීම | තනතුරු ඇති කිරීම අනුමත කිරීම | නව පත්වීම් ලබා පැමිණීම් | ස්ථාන මාරු කිරීම් | විශ්‍රාම ගැන්වීම් | සේවය අවසන් කිරීම් | බඳවා ගැනීම් | ස්ථාන මාරුවී පැමිණීම් | වෙනත් (සේවයෙන් ඉල්ලා අස්වීම) |
|---|---|---|---|---|---|---|---|---|---|
| **තැපැල්,තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාශය** | | | | | | | | | |
| ගරු අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් | - | - | 41 | - | - | 46 | - | - | - |
| ලේකම් | - | - | - | 01 | - | - | - | 01 | - |
| අතිරේක ලේකම් | - | - | - | 01 | 01 | - | - | 01 | - |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | - | 01 | - | - | - | - | - | 01 | - |
| අධ්‍යක්ෂ | - | 01 | - | - | - | - | - | 01 | - |
| සහකාර ලේකම් | - | - | - | 01 | - | - | - | - | - |
| භාෂා පරිවර්තක | - | - | - | 01 | - | - | - | 01 | 01 |
| සංවර්ධන නිලධාරී/ආශ්‍රිත නිලධාරී | - | - | 03 | 03 | - | - | - | - | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | - | 06 | 09 | - | - | - | 03 | - |
| රියදුරු සේවය | - | - | 04 | 01 | 01 | 02 | - | 02 | - |
| **තැපැල් දෙපාර්තමේන්තුව** | | | | | | | | | |
| ඒකාබද්ධ තැපැල් සේවය | - | - | - | - | 25 | - | - | - | - |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | - | - | - | 20 | - | - | - | - | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | - | - | - | 04 | - | - | - | - |
| **මුස්ලිම් ආගමික හාසංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව** | | | | | | | | | |
| - | - | - | - | - | - | - | - | - | - |

1. තැපැල් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් ද්විතියික පදනම මත සේවයෙන් නිදහස් කිරීම හා වෙනත් - 08
2. තැපැල් දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත හා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම - 25
3. වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරීන් නිදහස් කිරීම - 10

### 1.1.2 ඒකාබද්ධ තැපැල් සේවයේ නිලධාරීන්ගේ පත්කිරීම්, උසස්කිරීම්, නිත්‍ය තනතුරට අමතරව වැඩ බැලීමට පත්කිරීම හා අභියාචනා

i. ඒකාබද්ධ තැපැල් සේවයේ නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබාගැනීම.

ඉල්ලීම් යොමුකිරීම් - 08
අනුමැතිය ලබාදීම් - 04

ii. කළමනාකරණ සහකාර අධිපන්තියේ තනතුරුවලට අයත් සහකාර තැපැල් අධිකාරි (විමර්ශන)/සහකාර තැපැල් අධිකාරි (ගිණුම් පරීක්ෂක) තනතුරුවලට බඳවා ගැනීමට වන සීමිත තරඟ විභාගය 2017(2018) සඳහා සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.

iii. තැපැල් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය 111 ශ්‍රේණියේ තැපැල් අධිකාරී තනතුරට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය 2017 සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයට හා ආදර්ශ අයදුම් පත්‍රයට රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමැතිය ලබා දී ඇත.

iv. නිත්‍ය තනතුරට අමතරව වැඩ බැලීමට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට අදාළ කටයුතු

- ඒකාබද්ධ තැපැල් සේවයේ අ' 1 ශ්‍රේණියේ නියෝජ්‍ය තැපැල්පති තනතුරු - නිලධාරීන් 08 ක් සඳහා
- ඒකාබද්ධ තැපැල් සේවයේ අ' 11 ශ්‍රේණියේ තනතුරු - නිලධාරීන් 02 ක් සඳහා
- ඒකාබද්ධ තැපැල් සේවයේ අ' 111 අ' හා ඒකාබද්ධ තැපැල් සේවයේ අ' 111 ආ' ශ්‍රේණියේ තනතුරු - නිලධරයන් 30 ක් සඳහා

## 1.2 ආයතන මගින් විමසා ඇති වාර්තා සම්බන්ධ තොරතුරු

### 1.2.1 ඒ ඒ ආයතන විසින් කැඳවා ඇති වාර්තාවලට පිළිතුරු වාර්තා ඉදිරිපත් කිරීම් හා වාර්තා කැඳවීම්

| වාර්තා ඉදිරිපත් කළ ආයතන / අභියාචනා | ජනාධිපති කාර්යාලය | අගමැති කාර්යාලය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ වාර්තා ගණන | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කළ වාර්තා ගණන | ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කළ වාර්තා ගණන | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ වාර්තා ගණන | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ වාර්තා ගණන | තැපැල්පති වෙතින් කැඳවූ වාර්තා | | | අභියාචකයන් වෙත යවා ඇති පිළිතුරු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | අභියාචක වරුන්ගෙන් ලැබූ ලිපි ගණන | කැඳවූ වාර්තා ගණන | ලැබූ පිළිතුරු ගණන | |
| 1. උප තැපැල් ස්ථානාධිපති සේවය | - | - | 21 | - | - | - | 02 | 35 | 30 | 13 | 05 |
| 2. තැපැල් දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ සේවයේ විවිධ ගැටළු සම්බන්ධයෙන් | - | - | 17 | - | - | - | 05 | 50 | 32 | 18 | - |

| වාර්තා ඉදිරිපත් කළ ආයතන / අභියාචනා | ජනාධිපති කාර්යාලය | අගමැති කාර්යාලය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ වාර්තා ගණන | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කළ වාර්තා ගණන | ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කළ වාර්තා ගණන | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ වාර්තා ගණන | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ වාර්තා ගණන | තැපැල්පති වෙතින් කැඳවූ වාර්තා | | | අභියාචකවරුන් වෙත යවා ඇති පිළිතුරු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | අභියාචක වරුන්ගෙන් ලැබූ ලිපි ගණන | කැඳවූ වාර්තා ගණන | ලැබූ පිළිතුරු ගණන | |
| 3. ඒකාබද්ධ තැපැල් සේවයේ දැනට විශ්‍රාම ලබා ඇති නිලධාරීන් විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා | - | 15 | 94 | 39 | - | 03 | - | 30 | 184 | 79 | 37 |
| 4. අතිගරු ජනාධිපතිතුමා වෙත, ගරු අග්‍රාමාත්‍යතුමා වෙත හා ගරු අමාත්‍යතුමා වෙත ඉදිරිපත්වූ අභියාචනා වෙනුවෙන් | - | - | - | - | - | - | - | - | 57 | - | 31 |
| 5. ඒකාබද්ධ තැපැල් සේවයේ නියුතු විනය නියෝග ලැබූ හා වැඩ තහනම් කළ නිලධාරීන් | - | - | - | - | - | - | - | - | - | - | - |
| 6. වෘත්තීය සමිති කටයුතු | - | - | - | - | - | - | - | 18 | 18 | - | - |
| 7. අල්ලස් දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ විමසීම | - | - | - | - | - | - | - | - | 02 | - | - |
| **එකතුව** | **-** | **15** | **132** | **39** | **-** | **03** | **07** | **133** | **323** | **110** | **73** |

**1.2.2** මීට අමතරව පහත පරිදි වාර්තා සැපයීම් හා සංදේශ ඉදිරිපත් කිරීම් සිදු කර ඇත.

i. පිළිතුරු සැපයූ පාර්ලිමේන්තු ප්‍රශ්න ගණන - 03
ii. අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙතින් එවන ලද ලිපිවලට වාර්තා කැඳවීම - 10
iii. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ ගණන - 24
iv. තීරණ ලැබී ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ ගණන - 15

**1.2.3 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත අනුව කටයුතු කිරීම**

i. ලැබුණු ඉල්ලීම් ගණන - 60
ii. සම්පූර්ණ කළ ඉල්ලීම් ගණන - 58
iii. ප්‍රතික්ෂේප කළ ඉල්ලීම් ගණන - 00
iv. කටයුතු කරමින් පවතින ගණන - 02

**1.2.4 වෘත්තීය සමිති සාකච්ඡා පැවැත්වීම** - 04

## 1.3 තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ

i. හදිසි අනතුරු නිවාඩු අනුමත කිරීම් - 28
ii. විශේෂ නිවාඩු අනුමත කිරීම් - 19
iii.රා.පරි.ච. 22/93 යටතේ වන්දි ගෙවීම් - 13
iv. අභ්‍යාසලාභීන් ප්‍රායෝගික පුහුණුවේ යෙදවීම් - 26
v. තැපැල් අභ්‍යාස ආයතනවල උපදේශකවරුන්ට දීමනා ගෙවීමට අදාළ කටයුතු - 06

## 1.4 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්

i. කාර්ය මණ්ඩලය සඳහා අතිකාල හා ගමන් වියදම් අනුමත කිරීම්:

- සංස්කෘතික සහකාර හා මූල්‍ය සහකාර - 01
- සංවර්ධන නිලධාරීන් - 11
- කළමනාකරණ සහකාර - 02
- කාර්යාල කාර්ය සහායක - 02
- රියදුරන් - 04

## 1.5 අතිකාල, ගමන් වියදම්, සේවා හා පහසුකම් වෙනුවෙන් ඉදිරිපත් කරන ලද වවුචර්පත් සංඛ්‍යාව

| කාර්යය | වැය ශීර්ෂය | වවුචර්පත් ප්‍රමාණය |
|---|---|---|
| සේවා හා පහසුකම් | | |
| වාහන | | |
| නඩත්තු | 1301 | 164 |
| ඉන්ධන සැපයීම් | 1202 | 266 |
| රක්ෂණ කටයුතු | | 17 |
| සේවා | | |
| ජල හා විදුලි බිල්පත් | 1403 | 09 |
| සනීපාරක්ෂක | 1405 | 12 |
| ආරක්ෂක | | 11 |
| සංග්‍රහ | 1203 | 29 |
| උපකරණ නඩත්තු | 1302 | 39 |
| දුරකථන බිල්පත් පියවීම | | 551 |
| පුවත්පත් බිල්පත් පියවීම | | 165 |
| පානීය ජල බෝතල් සැපයීම | | 12 |
| කුලී ගෙවීම් හා වෙනත් (ගරු අමාත්‍ය හා ගරු නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය) | 1404 | 16 |
| අතිකාල/ගමන් වියදම් හා වෙනත් ගෙවීම් | | |
| අතිකාල | 1002 | 235 |

## 1.6 විදේශ නිවාඩු අනුමත කිරීම්

| නිවාඩු | අමාත්‍යාංශය | තැපැල් දෙපාර්තමේන්තුව | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව |
|---|---|---|---|
| පෞද්ගලික | 03 | 170 | 08 |
| රැකියා | - | 10 | - |

## 1.7 අභ්‍යාසලාභීන් ප්‍රායෝගික පුහුණුවේ යෙදවීම

| අමාත්‍යාංශය | තැපැල් දෙපාර්තමේන්තුව | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව |
|---|---|---|
| - | 26 | - |

## 1.8 තොරතුරු මාධ්‍ය ඒකකයේ කාර්යය භාරයන්

1.8.1 තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය, තැපැල් දෙපාර්තමේන්තුව හා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මෙම වසර තුළ ඉටු කරනු ලැබූ සේවා, සංවර්ධන හා සුබසාධන කාර්යයන් සම්බන්ධයෙන් මාධ්‍ය ඒකකය ඊට ප්‍රචාරණයක් ලබාදීමෙන් දායකත්වය සැපයීම.

1.8.2 බාහිර මාධ්‍ය ආයතන හා ඉතා සමීප සබඳතාවක් පවත්වා ගනිමින් මාධ්‍ය නිවේදන 120ක්, ප්‍රවෘත්ති සාකච්ඡා 20ක්, ඡායාරූප 600ක්, ප්‍රවෘත්ති වීඩියෝ කැසට් හා සී.ඩී පට 250ක් ප්‍රචාරණය සඳහා නිකුත් කිරීම.

## 1. 9 වෙනත් ආයතනික කටයුතු

1.9.1
- i. නිදහස් දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම් - 41, බිල්පත් පියවීම - 10
- ii. අග්‍රහාර රක්ෂණ වන්දි ඉල්ලුම් කිරීම - 11

1.9.2 ණය නිකුත් කිරීම්
- i. ආපදා ණය නිකුත් කළ නිලධාරීන් සංඛ්‍යාව - 55

1.9.3 සහනදායි මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම
- i. අමාත්‍යාංශය - 06
- ii. තැපැල් දෙපාර්තමේන්තුව - 18
- iii. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - 01
- iv. විශ්‍රාමික නිලධාරීන් සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට යොමු කිරීම - 03

1.9.4 පාර්ලිමේන්තුවට පියවන ලද බිල්පත් ගණන - 06

1.9.5 භාෂා පරිවර්තන සඳහා කරන ලද ගෙවීම් වවුචර් ගණන - 23

1.9.6 ගරු අමාත්‍යතුමා සඳහා ඉන්ධන නිකුත් කිරීම, වායු විමෝචන පරීක්ෂාවන් සිදු කිරීම, රියදුරු බලපත්‍ර අලුත් කිරීම, අතිරේක ඉන්ධන ලබා ගැනීම, සුළු මුදල් අත්තිකාරම් හා වෙනත් කාර්යයන් සඳහා යොමු කර ඇති වවුචර්පත් සංඛ්‍යාව - 143

1.9.7 ගරු අමාත්‍යතුමාගේ සංග්‍රහ වියදම් වවුචර් පත් පියවීම - 19
1.9.8 ගරු අමාත්‍යතුමාගේ නිල නිවාස වියදම් ගෙවීම් වවුචර් පියවීම - 16
1.9.9 මාණ්ඩලික නිලධාරීන්ගේ ගමන් වියදම් ඉල්ලුම්පත් පියවීම - 09
1.9.10 මාණ්ඩලික නොවන නිලධාරීන් හා කා.කා.ස. සේවයේ අතිකාල හා ගමන් වියදම් පියවීම - 116
1.9.11 මාණ්ඩලික නිලධාරීන්ගේ 1/20 දීමනා ගෙවීම - 26
1.9.12 නිල හැඳුනුම්පත් නිකුත් කිරිම - 06
1.9.13 ගරු අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා ගමන් වියදම් හා අතිකාල ඉල්ලුම්පත් පියවීම - 107
1.9.14 නිදහස් දුම්රිය වාර ප්‍රවේශපත්‍ර ඉල්ලුම්පත් සකසා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යැවීම - 16
1.9.15 තැපැල් දෙපාර්තමේන්තු බාහිර කම්කරු සේවිකාවන්ගේ රාජකාරී දින සහතික කිරීම - 12
1.9.16 රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ ලියාපදිංචිය සඳහා අයදුම්පත් යොමු කිරීම - 04
1.9.17 රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අයදුම්පත් යොමු කිරීම් - 06

## 1. 10 දේශීය හා විදේශීය පුහුණු අවස්ථා

| ආයතනය | මාණ්ඩලික නිලධාරී | | සංවර්ධන නිලධාරී | | කළමනාකරණ සහකාර | | තැපැල් සේවා හා අනෙකුත් නිලධාරීන් | රියදුරු | | කාර්යාල කාර්ය සහායක | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | පුහුණු වැඩසටහන් ගණන | සංඛ්‍යාව | පුහුණු වැඩසටහන් ගණන | සංඛ්‍යාව | පුහුණු වැඩසටහන් ගණන | සංඛ්‍යාව | සංඛ්‍යාව | පුහුණු වැඩසටහන් ගණන | සංඛ්‍යාව | පුහුණු වැඩසටහන් ගණන |
| දේශීය පුහුණු වැඩසටහන් | | | | | | | | | | | |
| අමාත්‍යාංශය | 07 | 11 | 19 | 24 | 18 | 24 | - | 04 | 01 | 08 | 07 |
| විදේශීය පුහුණු වැඩසටහන්/සමුළු සඳහා සහභාගිවීම් | | | | | | | | | | | |
| අමාත්‍යාංශය | 05 | - | 01 | - | - | - | - | - | - | - | - |
| තැපැල් දෙපාර්තමේන්තුව | 33 | - | - | - | - | - | 14 | - | - | - | - |
| මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 02 | - | - | - | - | - | - | - | - | - | - |

# 02 සංවර්ධන සහ සැලසුම් කටයුතු

## 2.1 ප්‍රගති සමාලෝචන කටයුතු හා වාර්ෂික කාර්ය සාධන කටයුතු

- තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ වෙන්වී ඇති අයවැය ඇස්තමේන්තුවලට අනුව 2018 වසරේ ක්‍රියාකාරී සැලැස්ම රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2014 ට අනුව සකස් කොට මුදල් අමාත්‍යාංශය, විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. තැපැල් දෙපාර්තමේන්තුව, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවලට වෙන්වී ඇති අයවැය ඇස්තමේන්තුවලට අනුව 2018 වසරේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.
- 2017 වසරේ තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ සියලු අංශ වලට අදාළ තොරතුරු ලබා ගනිමින්, කාර්ය සාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කරන ලද අතර මුදල් අමාත්‍යාංශය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව ඇතුලු අදාළ ආයතන වෙත ද යොමු කරන ලදී.
- 2017 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුව සහ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් සකස් කරන ලද එම දෙපාර්තමේන්තුවල කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට යොමු කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.
- දිවයින පුරා ක්‍රියාත්මක වන තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු වලට අදාළ සංවර්ධන වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් කාර්තුමය වශයෙන් පවත්වා ඇති අතර තැපැල් දෙපාර්තමේන්තුවේ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් වන යෝජනාවලට අදාළව මෙහෙයුම් කමිටු රැස්වීම් කාර්තුමය වශයෙන් පවත්වා ඊට අදාළ තීරණ ක්‍රියාත්මක කර ඇත.
- ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් විමසනු ලබන තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳ ප්‍රගතිය වාර්තා කිරීම සිදුකරන ලදී.

  2018 වසරේ ජනාධිපති ලේකම් කාර්යාලයට හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට කාර්තුමය වශයෙන් ප්‍රගතිය වාර්තා කරන ලද ව්‍යාපෘති /වැඩසටහන්වල විස්තර පහත පරිදි වේ.

➢ **භෞතික ප්‍රගතිය -** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය

(අමාත්‍යාංශයට අනුමත ප්‍රාග්ධන අරමුදල් යටතේ ක්‍රියාත්මක වී ඇත.)

| ව්‍යාපෘතියේ නම | 2018 වසරට වෙන් වූ මුදල රු. මි. | 2018 වසරේ වැය කළ මුදල රු. මි. | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | විස්තරය | % |
| පුරා විද්‍යාත්මක වටිනාකමින් යුත් මුස්ලිම් ආගමික ස්ථාන පිළිසකර කර නඟා සිටුවීම | 24.250 | 23.291 | දිස්ත්‍රික්ක 12ක තෝරාගත් මුස්ලිම් පල්ලි 12ක සංවර්ධන කටයුතු සිදු කරන ලදී. | 100 |
| මුද්දර ප්‍රවර්ධනය | 1.000 | 0.980 | තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර ප්‍රවර්ධන වැඩසටහනට යොදවන ලදී. | 100 |

- **භෞතික ප්‍රගතිය -** තැපැල් දෙපාර්තමේන්තුව

(තැපැල් දෙපාර්තමේන්තුවට අනුමත ප්‍රාග්ධන අරමුදල් යටතේ ක්‍රියාත්මක වී ඇත)

| ව්‍යාපෘතියේ නම | **2018** වසරට වෙන් වූ මුදල රු. මි. | **2018** වසරේ වැය කළ මුදල රු. මි. | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | විස්තරය | % |
| තැපැල් කාර්යාල ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම | 160.000 | 159.094 | මේ යටතේ තැපැල් දෙපාර්තමේන්තුවට අයත් දිවයින පුරා පිහිටි තැපැල් කාර්යාල සහ ආයතනවල අලුත්වැඩියා වැඩ 269ක් සිදු කරන ලදී. | 98 |
| තැපැල් කාර්යාල හා දෙපාර්තමේන්තුවට අයත් ආයතන සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබාදීම | 32.000 | 31.836 | දිවයින පුරා පිහිටි තැපැල් දෙපාර්තමේන්තුවට අයත් තැපැල් කාර්යාල සහ ආයතන සඳහා අවශ්‍යතාවය අනුව කාර්යාලීය උපකරණ ලබා දී ඇත. | 99 |
| තැපැල් කාර්යාල හා දෙපාර්තමේන්තුවට අයත් ආයතන සඳහා යන්ත්‍රෝපකරණ ලබාදීම | 45.000 | 44.783 | දිවයින පුරා පිහිටි තැපැල් දෙපාර්තමේන්තුවට අයත් තැපැල් කාර්යාල සහ ආයතන සඳහා අවශ්‍යතාවය අනුව යන්ත්‍රෝපකරණ ලබා දී ඇත. | 98 |
| පූජාපිටිය තැපැල් කාර්යාලය ඉදිකිරීම | 28.600 | 7.619 | මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි. අමතර වැඩ වශයෙන් පස් කැපීම සහ පැති බැම්ම බැඳීම නිසා ඉදිකිරීම් ප්‍රමාද විය. (Delay due to extra work of earth cutting and retaining wall construction.) | 65 |
| මුද්දර ප්‍රවර්ධනය | 4.00 | 3.499 | මුද්දර ප්‍රවර්ධනය යටතේ තැපැල් දෙපාර්තමේන්තුවට වෙන්වූ මුදල රු. මිලියන 3.00කි. අමාත්‍යාංශයෙන් මේ සඳහා රු. මිලියන 1.00ක් ලබා දෙන ලදී. මීගමුව හා කුරුණෑගල තැපැල් කාර්යාලවල මුද්දර කාර්යාංශ කවුළු 02ක් පිහිටුවා අවශ්‍ය කාර්යාලීය උපකරණ ලබාදීම, අන්තර්ජාලය හරහා මුද්දර ගණුදෙනු සිදුකිරීම සඳහා හඳුන්වාදුන් මොඩියුලය වැඩිදියුණු කිරීම, මුද්දර සඳහා ඡායාරූප ලබා ගැනීමට ඩ්‍රෝන කැමරාවක් මිලදී ගැනීම, ශ්‍රී ලංකා මුද්දර විශ්ව තැපැල් සංගමයේ වෙබ් අඩවියේ WNS ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි කිරීම සහ ජාත්‍යන්තර සහ දේශීය මුද්දර ප්‍රදර්ශනවලට සහභාගීවීම ඇතුළු කාර්යයන් සිදුකරන ලදි. | 100 |

- **භෞතික ප්‍රගතිය -** මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

(මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට අනුමත ප්‍රාග්ධන අරමුදල් යටතේ ක්‍රියාත්මක වී ඇත)

| ව්‍යාපෘතියේ නම | **2018** වසරට වෙන් වූ මුදල රු. මි. | **2018** වසරේ වැය කළ මුදල රු. මි. | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | විස්තරය | % |
| ජාතික මීලාදුන් නබී සංවර්ධන වැඩසටහන | 20.00 | 19.51 | මෙම වැඩසටහන යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මුස්ලිම් පල්ලි සහ ආගමික ස්ථාන 55ක් සංවර්ධනය කරන ලදී. | 100 |
| මුස්ලිම් ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම | 25.00 | 24.28 | මෙම වැඩසටහන යටතේ දිවයින පුරා මුස්ලිම් පල්ලි සහ ආගමික ස්ථාන 121ක් සංවර්ධනය කරන ලදී. | 99 |

- **2018.12.31 දිනට අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවල මූල්‍ය ප්‍රගතිය**

| ආයතනය | පුනරාවර්තන අරමුදල් | | | ප්‍රාග්ධන අරමුදල් | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කළ මුදල රු. මිලියන | වියදම රු. මිලියන | % | වෙන් කළ මුදල රු. මිලියන | වියදම රු. මිලියන | % | වෙන් කළ මුදල රු. මිලියන | වියදම රු. මිලියන | % |
| තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 124.905 | 102.509 | 82.0 | 46.065 | 43.026 | 93.4 | 170.970 | 145.535 | 85.1 |
| තැපැල් දෙපාර්තමේන්තුව | 12,932.500 | 12,896.557 | 99.7 | 301.600 | 277.881 | 92.1 | 13,234.100 | 13,174.438 | 99.5 |
| මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 248.200 | 233.789 | 94.2 | 59.700 | 47.702 | 79.9 | 307.900 | 281.491 | 91.4 |
| එකතුව | **13,305.605** | **13,232.855** | **99.5** | **407.365** | **368.609** | **90.5** | **13,712.970** | **13,601.464** | **99.2** |

- ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ තැපැල් සේවා කටයුතු වෙනුවෙන් උප තැපැල් කාර්යාල හා තැපැල් කාර්යාල සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ හා පවරා ගැනීම් වලට අදාළව (ලිපිගොනු 337ක පමණ) කටයුතු කරනු ලැබේ.

  මහවෙල හා ගල්ගමුව තැපැල් කාර්යාල පවරා ගැනීම, වතුරාව හා ලිහිරියාගම උප තැපැල් කාර්යාලය සඳහා ඉඩම් පවරා ගැනීම, පයාගල හා ආණමඩුව තැපැල් කාර්යාල සඳහා ඉඩම් අත්පත් කර ගැනීම, සේරුකැලේ උප තැපැල් කාර්යාල අත්පත් කර ගැනීම සඳහා අදාළ වන ගොනුවල කටයුතු අවසන් කර ඇත.

- පූජාපිටිය තැපැල් කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතී. මේ සම්බන්ධයෙන් අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

- තැපැල් දෙපාර්තමේන්තුව විසින් දැනටමත් පෞද්ගලික අංශය සමග ගිවිසුම්ගතව කටයුතු ආරම්භ කර ඇති විවිධ සේවාවන් සම්බන්ධයෙන් ගිවිසුම්ගත වීමට අදාළව මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය හා නීතිපති උපදෙස් ලබා ගැනීමට පියවර ගැනීම සහ එම ගිවිසුම් සම්බන්ධයෙන් තැපැල්පති වෙත අදාළ උපදෙස් හා අනුමැතීන් ලබා දී ඇත.

- මුද්‍රිත මාධ්‍ය ඔස්සේ කරනු ලබන පැමිණිලි හා යෝජනා සැලකිල්ලට ගෙන අදාළ ගැටලු විසඳමින් තැපැල් සේවා ප්‍රවර්ධනය සඳහා පියවර ගෙන ඇති අතර ජනාධිපති කාර්යාලය මගින් ක්‍රියාත්මක "ජනපතිට කියන්න" වැඩසටහන මගින් ද , අග්‍රාමාත්‍ය කාර්යාලය, අනෙකුත් රජයේ ආයතන මෙන්ම මහජනතාව වෙතින් ලැබෙන ඉල්ලීම්, යෝජනා සහ චෝදනා සම්බන්ධයෙන් තැපැල්පති වෙත අදාළ උපදෙස් ලබා දීම සහ ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග අදාළ පුද්ගලයින්ට හෝ ආයතන වෙත දැනුම් දී ඇත.

- ලෝක තැපැල් දිනය 2018 සැමරීමට අදාළ කාර්යක්ෂම තැපැල් කාර්යාල තේරීමේ තරගය, පාසල් සිසුන් සඳහා වන චිත්‍ර හා රචනා තරඟය පැවැත්වීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

- **ලෝක තැපැල් දිනය 2018 - හොඳම තැපැල් කාර්යාල තේරීම**

ලෝක තැපැල් දින ජාතික උත්සවයට සමගාමීව තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය සහ තැපැල් දෙපාර්තමේන්තුව සංවිධානය කළ දිවයිනේ හොඳම තැපැල් කාර්යාල තේරීම සඳහා දිවයින පුරා, පහත සඳහන් නිර්දේශිත තැපැල් කාර්යාල රැසක ක්ෂේත්‍ර චාරිකාවල නිරත වී අධීක්ෂණය සහ එම විනිශ්චය ලබා දීමට දායකත්වය ලබා දෙන ලදී.

| ප්‍රධාන තැපැල් කාර්යාල | I පෙළ තැපැල් කාර්යාල | II පෙළ තැපැල් කාර්යාල | උප තැපැල් කාර්යාල |
|---|---|---|---|
| මාතර | අම්බලංතොට | කටුවන | අමුගොඩ |
| නුවරඑළිය | තලාතුඔය | පුස්සැල්ලාව | මීණිපේ |
| කුලියාපිටිය | දුම්මලසූරිය | වයික්කාල | එළිබිච්චිය |
| බණ්ඩාරවෙල | හාලිඇල | කන්දෙගෙදර | පිටමාරුව |
| අනුරාධපුර | මැදිරිගිරිය | විජිතපුර | නෙලුම්වැව |
| සීතාවකපුර | බුලත්සිංහල | කොස්ගම | හිඹුටාණ |
| බළංගොඩ | රුවන්වැල්ල | බෙලිහුල්ඔය | ඉඹුල්ගස්දෙණිය |
| ත්‍රිකුණාමලය | උහණ | ආරියම්පති | ගොනාගොල්ල |
| මන්නාරම | චුල්ලිපුර | කෛතඩි | මාදගල් |
| මීගමුව | ජාඇල | බුත්පිටිය | බඩල්ගම |

| නියෝජ්‍ය තැපැල් කාර්යාල | ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාල | දිසා පාලන නිලධාරි කාර්යාල | දිසා ගණකාධිකාරි කාර්යාල |
|---|---|---|---|
| වයඹ | පුත්තලම(හලාවත) | කුරුණෑගල | කුරුණෑගල |
| මධ්‍යම | මහනුවර | මහනුවර | මහනුවර |
| උතුරුමැද | අනුරාධපුර | අනුරාධපුර | අනුරාධපුර |
| ඌව | බදුල්ල | බදුල්ල | බදුල්ල |
| | කළුතර | කළුතර | කොළඹ දකුණ |
| | | ගම්පහ | |
| | කෑගල්ල | කෑගල්ල | රත්නපුර |
| | අක්කරපත්තුව | | |
| | මාතර | මාතර | මාතර |

සේවක අභිප්‍රේරණය මගින් තැපැල් සේවයේ ඉහළ ඵලදායිතාවක් ඇති කරලීම මෙහි මුඛ්‍ය පරමාර්ථය විය.

- ත්‍රිකුණාමලය, වත්තේගම සහ හපුතලේ යන ස්ථානවල නව නියෝජිත තැපැල් කාර්යාල 03ක් පිහිටුවීමට අනුමැතිය ලබා දීමට අදාළ කටයුතු සිදු කර ඇත.
- අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ කටයුතු තැපැල් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයේ සහාය ඇතිව සිදු කිරීම සහ මහජන තොරතුරු කේන්ද්‍රයේ මෙම අමාත්‍යාංශයේ තොරතුරු යාවත්කාලීන කිරීම හා අනුබද්ධ දෙපාර්තමේන්තුවල තොරතුරු යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
- තැපැල් සේවා සංවර්ධනයට අදාළ නව ව්‍යාපෘති, යෝජනා හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ කටයුතු සම්බන්ධීකරණය සිදු කර ඇත.
- තැපැල් කාර්යාල ඇප අරමුදල ආඥා පනත සංශෝධනය කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් පවතින අතර තැපැල් කාර්යාල ඇප අරමුදල, ආඥා පනතට අනුව කළමනාකරණ මණ්ඩලය සඳහා සාමාජිකයින් පත් කිරීමට අවශ්‍ය අනුමැතීන් ලබා දී ඇත.
- 2018 දේශීය හා විදේශීය තැපැල් ගාස්තු සංශෝධනයට අදාළ කටයුතු සිදු කර ඇත.

## 2.2 මුද්දර ප්‍රවර්ධන වැඩසටහන්

මුද්දර ප්‍රතිපත්තියට හා අනුමත වාර්ෂික මුද්දර වැඩසටහනට අනුව ගුණාත්මක මුද්දර නිකුත් කිරීම සඳහා චිත්‍ර ආකෘතීන්ට අනුමැතිය ලබාදීම

- මුද්දර ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.
- වාර්ෂික මුද්දර වැඩසටහන සඳහා අනුමැතිය ලබාගෙන ඇත.
- වාර්ෂික මුද්දර වැඩසටහන ඇතුළත් නොවූ මුද්දර සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කර ඇත.
- මුද්දරමය වටිනාකම සුරකෙන පරිදි ගුණාත්මකභාවයෙන් යුතු මුද්දර මුද්‍රණය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු සිදු කර ඇත.
- තැපැල්පතිගේ නිර්දේශ සහිතව මුද්දර උපදේශක මණ්ඩලය පත් කර ඇත.
- මුද්දර නිර්මාණ ඇගයීම් කමිටුව සඳහා නිරීක්ෂණ මට්ටමින් නියෝජිතයකු පත් කර ඇත.

**2018 වාර්ෂික මුද්දර වැඩසටහනට ඇතුළත් වූ අනුමැතීන් ලබා දෙන ලද මුද්දර චිත්‍ර ආකෘතීන් සංඛ්‍යාව පහත පරිදි වේ.**

| | තේමාව | නිකුත් කළ මුද්දර සංඛ්‍යාව | සිහිවටන පත්‍රිකා ගණන |
|---|---|---|---|
| 01. | වාර්ෂික නිකුත් කිරීම් | | |
| | 1.1 වෙසක් උත්සවය | 04 | 01 |
| | 1.2 නත්තල් උත්සවය | 02 | 01 |
| 02. | සම්භාවනීය පුද්ගලයින් | | |
| | 2.1 රත්මලානේ ශ්‍රී ධර්මාරාම මාහිමි | 01 | - |
| 03. | ලෝක තැපැල් දිනය | 01 | - |
| 04. | ලෝක ළමා දිනය | 01 | - |
| 05. | ජාතික සිදුවීම් | | |
| | 5.1 ජාතික නිදහස් දිනය | 01 | - |
| | 5.2 ඌව වෙල්ලස්ස විමුක්ති අරගලය | 01 | - |
| | **එකතුව** | 11 | 02 |

**2018 වාර්ෂික මුද්දර වැඩසටහනට අතිරේක වශයෙන් අනුමැතීන් ලබා දුන් මුද්දර සංඛ්‍යාව පහත පරිදි වේ.**

| | තේමාව | නිකුත් කළ මුද්දර සංඛ්‍යාව | සිහිවටන පත්‍රිකා ගණන |
|---|---|---|---|
| 01. | ආදායම් මුද්දර | 01 | - |
| 02. | නිත්‍ය කාණ්ඩයේ මුද්දර (ශ්‍රී ලංකාවේ වන සතුන්) | 03 | - |
| 03. | ලෝක ධර්මදූත ළමා සමාජයේ 175 වන සංවත්සරය | 01 | - |
| 04. | ශ්‍රී ලංකාවේ ප්‍රදීපාගාර | 04 | 04 |
| 05. | ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තයේ සියවස | 01 | - |
| 06. | ජාත්‍යන්තර සිංහ සමාජයේ සභාපතිනියගේ ශ්‍රී ලංකා සංචාරය | 01 | - |
| 07. | ලෝක වකුගඩු දිනය | 01 | - |
| 08. | ලෝක සෞඛ්‍ය දිනය | 01 | - |
| | එකතුව | 13 | 04 |

**2018 වර්ෂයට පෙර වාර්ෂික මුද්දර වැඩසටහන්වල ඇතුළත් අනුමැතීන් ලබා දුන් මුද්දර සංඛ්‍යාව පහත පරිදි වේ.**

| | තේමාව | නිකුත් කළ මුද්දර සංඛ්‍යාව | සිහිවටන පත්‍රිකා ගණන |
|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකාවේ අම්බලම් | 04 | 01 |
| 02. | දහඅට සන්නිය | 18 | 03 |

## 2.3 පුස්තකාල පහසුකම් සැපයීම

අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ ගුණාත්මක ආකල්ප වර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් විවිධ විෂයයන්ට අදාළ පොත් 1372 කින් පමණ යුත් පුස්තකාලයක් පවත්වා ගෙන යනු ලබන අතර සතියකට දින දෙකක දි පැයක පමණ කාලයක් තුළ සාමාජිකයින්හට පොත් බැහැර ගෙන යාමට අවස්ථාව ලබාදීමට අදාළ කටයුතු සිදු කර ඇත.

## 2.4 බලශක්ති සංරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම

රාජ්‍ය ආයතන තුළ අරපිරිමැස්මෙන් යුතු විදුලි පාරිභෝජන රටාවක් ඇතිකිරීම සහ එමගින් බලශක්තිය ඉතිරිකරගැනීම සඳහා හඳුන්වා දී ඇති බලශක්ති සංරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම 2015 වසරේ දෙසැම්බර් මස සිට අමාත්‍යාංශයේ සියලුම අංශ කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක විය. මේ සඳහා පත්කරන ලද බලශක්ති කළමනාකරුවකු යටතේ අදාළ සංරක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කරමින් විදුලි පාරිභෝජනය 10% කින් අඩු කරගැනීමට කටයුතු යොදනු ලැබිණ. එමෙන්ම මාසිකව එහි ප්‍රගතිය නිරීක්ෂණය කිරීමටත් කටයුතු යොදනු ලැබිණ.

තවද සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සංවිධානය කර බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේදී සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද බලශක්ති කළමනාකරුවන් දැනුවත් කිරීම සඳහා වූ සමුළුවලටද සහභාගි වී බලශක්ති සංරක්ෂණ ක්‍රමවේද පිළිබඳ දැනුම වැඩිදියුණු කරගන්නා ලදී. තවද හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේ පවත්වන ලද

බලශක්ති කළමනාකරුවන් පුහුණු කිරීමේ දෙදින වැඩසටහනට ද සහභාගි වන ලදී. බලශක්ති සංරක්ෂණ අරමුණු මුදුන්පමුණුවා ගැනීම සඳහා වූ හරිත ඵලදායිතා වැඩසටහන ද මීට සමගාමී ව ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස 2015, 2016 වර්ෂවලට සාපේක්ෂව 2017 වර්ෂයේ මෙන්ම 2018 වර්ෂයේ ද අමාත්‍යාංශයේ විදුලි පාරිභෝජනයේ අඩු වීමක් නිරීක්ෂණය වී ඇත.

## 2.5 ඩෙංගු උවදුර දුරලීමේ වැඩසටහන

ඩෙංගු වසංගතය දුරලීම සඳහා ජනාධිපති කාර්යාලය විසින් සංවිධානය කරනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගි වන අතර අමාත්‍යාංශයේ සිදුකරන ලද ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රගතිය ජනාධිපති කාර්යාලයට වාර්තා කිරීමත් සිදුවිය.

## 2.6 එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය 2018 - මොණරාගල

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ග්‍රාමීය ව්‍යවසායකයන් දිරි ගැන්වීම සඳහා ඔවුන්ට දැනුම, මූල්‍ය සහය සහ උපදේශනය සැපයීමත්, සංහිඳියාව පිළිබඳ පුළුල් කතිකාවතක් ඇති කිරීම සහ නීල හරිත ගම් පෙරළිය වැඩසටහන තේමා කොට මොණරාගල දී 2018.08.29 සිට 2018.08.31 දක්වා පවත්වන ලද එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා ව්‍යවසායකත්ව ප්‍රදර්ශනය සඳහා අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තු ඒකාබද්ධව සහභාගි විය.

## 2.7 තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම

තිරසර හා වනජීවි අමාත්‍යාංශයේ දැනුවත් කිරීම් වැඩමුළු සඳහා සහභාගී වූ අතර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු හා මේ සම්බන්ධ සාකච්ඡා කර අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව ළඟා කරගත හැකි තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම කාර්යසාධන දර්ශක හා වැඩසටහන් හඳුනා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

## 2.8 වෙනත් සංවර්ධන වැඩසටහන්

අමාත්‍යාංශය තුළ ඵලදායිතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නව තත්ව කව පිහිටුවීමට සහ රැස්වීම් පවත්වා වාර්තා කරන ලෙස අංශ ප්‍රධානින් දැනුවත් කර ඇත.

ජනාධිපති චක්‍රලේඛ අංක. එස්පි/එස්බී/03/10 හා 2010.05.31 හි උපදෙස් පරිදි අමාත්‍යාංශය තුළ ඉ - රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කර ගෙන යනු ලැබේ. මේ යටතේ අමාත්‍යාංශය තුළ LGN WiFi අන්තර්ජාල පහසුකම් සැපයීමට අදාළ කටයුතු සිදු කර ඇති අතර සියලුම නිලධාරින්ට රාජකාරී විද්‍යුත් තැපැල් ලිපිනයන් (e-mail accounts) සකස් කර දීමට කටයුතු ආරම්භ කර ඇත. තවද තොරතුරු දැන ගැනීමේ පනත යටතේ අමාත්‍යාංශය සතු සියලු වාර්තා විද්‍යුත් ලේඛනාකෘතියෙන් ආරක්ෂා කිරීමටද කටයුතු ආරම්භ කර ඇත.

# 03. මුස්ලිම් ආගමික කටයුතු

2018.01.01 සිට 2018.12.31 දක්වා කාලය තුළ පහත සඳහන් කාර්යයන් මෙම අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර ඇත.

**3.1** 2018 වසරේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සැලසුම් කළ කටයුතුවල ප්‍රගතිය අත්කර දීමට අවශ්‍ය උපදෙස් ලබා දීම හා අධීක්ෂණය කටයුතු සිදු කරන ලදී.

**3.2 හජ් කටයුතු සම්බන්ධීකරණය**

3.2.1 හජ් පනත් කෙටුම්පතක් සකසා ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇත.

3.2.2 හජ් කටයුතු සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබෙන ලිපි මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ උපදෙස් සමඟ ඉදිරි කටයුතු කිරීමට යොමු කර ඇත.

3.2.3 හජ් වන්දනා කරුවන් සඳහා ලබා දෙන ඖෂධ සම්බන්ධ විස්තර ලේකම්තුමාගේ අනුමැතිය සමඟ තානාපති කාර්යාලයට යොමු කිරීම සිදු කර ඇත.

**3.3 වකුෆ් සභාවේ කටයුතු සම්බන්ධීකරණය**

3.3.1 වකුෆ් පනතට අනුව වකුෆ් විනිශ්චය සභාවේ හා වකුෆ් සභාවේ ලේකම් තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් දෙදෙනෙකු පත් කර ඇත.

3.3.2 වකුෆ් සභා සාමාජිකයින්ගේ දීමනා වැඩි කිරීම් (දෛනික දීමනා හා ප්‍රවාහන දීමනා) සම්බන්ධයෙන් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දෙන ලද අතර හා එහි පැවති රැස්වීම්වලට ද සහභාගී විය.

3.3.3 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමන්ට වකුෆ් සභාවේ සාමාජිකත්වය ලබාදීම හා වකුෆ් සභාවේ අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම ද සිදු කරන ලදී.

**3.4** 2018 **අයවැය යෝජනා අනුව පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත මුස්ලිම් ආගමික සිද්ධස්ථාන ප්‍රතිෂ්ඨාපනය කිරීම.**

3.4.1 2018 අයවැය යෝජනා අනුව පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත මුස්ලිම් ආගමික සිද්ධස්ථාන ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා රුපියල් මිලියන 24.25ක මුදලක් වෙන් වූ අතර එම මුදල යොදවා පහත පරිදි මස්ජිදයන් 12ක අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

| # | යෝජිත මස්ජිදයන් | වෙන් කරන ලද මුදල (රු.මි.) | වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | හයිතුනබි මස්ජිදය<br>දි.ලේ.කා. - අම්පාර / ප්‍රා.ලේ.කා. - සමන්තුරේ | 2.00 | 1.98 | 100% |
| 2. | මොහිදීන් ජුම්මා මස්ජිදය<br>දි.ලේ.කා. - නුවරඑළිය / ප්‍රා.ලේ.කා. - නුවරඑළිය | 2.00 | 1.94 | 100% |
| 3. | මොහිදීන් ජුම්මා මස්ජිදය<br>දි.ලේ.කා - පුත්තලම / ප්‍රා.ලේ.කා. - පුත්තලම | 2.00 | 1.99 | 100% |
| 4. | මස්ජිදුල් නුරාණියා මස්ජිදය<br>දි.ලේ.කා. - අනුරාධපුර / ප්‍රා.ලේ.කා. - ඉපලෝගම | 2.00 | 1.95 | 100% |

| # | යෝජිත මස්ජිදයන් | වෙන් කරන ලද මුදල (රු.මි.) | වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 5. | මොහිදීන් ජුම්මා මස්ජිදය<br>දි.ලේ.කා. - පොළොන්නරුව/ ප්‍රා.ලේ.කා. - තමන්කඩුව | 2.00 | 2.00 | 100% |
| *6.* | මීරා මස්ජිදය<br>දි.ලේ.කා. - ගාල්ල / ප්‍රා.ලේ.කා. - කඩවත් සතර | *2.00* | *1.88* | *100%* |
| *7.* | වලියප්පා තක්කියා මස්ජිදය<br>දි.ලේ.කා. - මඩකලපුව / ප්‍රා.ලේ.කා. - එරාවූර් | *2.00* | *1.84* | *100%* |
| *8.* | රක්ෂපාන මස්ජිදය<br>දි.ලේ.කා. - ගම්පහ / ප්‍රා.ලේ.කා. - බියගම | *2.00* | *1.99* | *100%* |
| *9.* | මොහිදීන් ජුම්මා මස්ජිදය<br>දි.ලේ.කා. - මොණරාගල /ප්‍රා.ලේ.කා. - මැදගම | *2.00* | *1.97* | *100%* |
| *10.* | මස්ජිදුල් අබ්රාර්<br>දි.ලේ.කා. - කළුතර / ප්‍රා.ලේ.කා. - බේරුවල | *2.00* | *1.90* | *100%* |
| *11.* | මසජිදුල් අක්බාර් මස්ජිදය<br>දි.ලේ.කා. - කොළඹ / ප්‍රා.ලේ.කා. - කොළඹ | *2.00* | *1.91* | *100%* |
| *12.* | මීරා මකාම් මස්ජිදය<br>දි.ලේ.කා. - නුවර / ප්‍රා.ලේ.කා. - ගඟවටකෝරලය | *2.25* | *1.94* | *100%* |
| | ***එකතුව*** | ***24.25*** | ***23.29*** | ***100%*** |

*දි.ලේ.කා.*- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රා.ලේ.කා. - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

මස්ජිදයන් 12 සඳහා අයත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් හා මස්ජිදයන්හි දායක සභාවේ නිලධාරීන් ගෙන්වා අදාළ කාර්යයන් වර්ෂ අවසානයට පෙර නවීකරණය හා ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කටයුතු අවසන් කිරීමට, ඇස්තමේන්තු සකස් කිරීමේදී හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී පැවති ගැටලු නිරාකරණය කර ගැනීමට අමාත්‍යාංශ ලේකම්තුමා විසින් උපදෙස් ලබා දෙන ලදී. 2018.12.31 වන විට මස්ජිදයන් 12හි නවීකරණය හා ප්‍රතිෂ්ඨාපනය කිරීමේ සමස්ත ප්‍රගතිය 100%කි.

## 3.5 අරාබි විද්‍යාල කටයුතු සම්බන්ධීකරණය

3.5.1 මෙරට සියලු අරාබි විදුහල් සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් අ.පො.ස (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස (උසස් පෙළ) හා සමාන විභාග දෙකක් පවත්වන බැවින් ඊට ඉහල විභාග පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුව එකඟ නොවන බැව් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ප්‍රගති සමාලෝචන රැස්වීමේදී පවසන ලදී. මේ තත්වය මත පිළිගත් එකම විභාග පැවැත්වීමේ අපහසුතාවයක් පැවතියද තව දුරටත් විභාග දෙපාර්තමේන්තුව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම සමඟ සාකච්ඡාවක් පවත්වා ඉදිරි කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

## 3.6 මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තු සංකීර්ණයේ කටයුතු සම්බන්ධීකරණය

3.6.1 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු සංකීර්ණයේ ඉතිරි මහල් 06ක වැඩ තව දුරටත් නිම කිරීමට ඉතිරිව ඇති බැවින් ඒ සඳහා සැලසුම් සකස් කරමින් පවතී. මෙම ඉතිරි මහල්වල වකුෆ් මණ්ඩලය, වකුෆ් විනිශ්චය සභාව, පර්යේෂණ මධ්‍යස්ථානය, පුස්තකාලය, හජ් කමිටු කාර්යාලය, ක්වාසි මණ්ඩලය හා රජයේ විගණන අංශයත් ඊට අමතරව ශ්‍රවණාගාරයත් ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ.

## 3.7 2018 රටඉඳි බෙදාහැරීමේ කටයුතු සම්බන්ධීකරණය

3.7.1 2018 රාමසාන් උත්සවය වෙනුවෙන් සවුදි අරාබි රාජ්‍යයේ පරිත්‍යාග ලෙස ශ්‍රී ලංකා රජයට ලබා දෙන රටඉඳි ලබාදීම ප්‍රමාද වූ බැවින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සමූපකාර තොග වෙළඳ සංස්ථාවෙන් රටඉඳි මෙට්‍රික් ටොන් 250ක් ලබා ගෙන මස්ජිදයන් හරහා මුස්ලිම් ජනතාව වෙත නිසි පරිදි බෙදා හැරිමට අධ්‍යක්ෂක වෙත උපදෙස් නිකුත් කිරීම හා ඒවා බෙදා හැරීමේ වාර්තා මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලදී.

3.7.2 ඊට අමතරව රාමසාන් උපවාස කාලයේ අවසන් භාගයේදී සවුදි අරාබියෙන් පරිත්‍යාග ලෙස ලද රටඉඳි මෙට්‍රික් ටොන් 150ක් අමාත්‍යාංශයේ අධීක්ෂණය මත මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් බෙදාහැරීමේ කටයුතු සිදු කරන ලදී.

3.7.3 මේ වසරේ මුස්ලිම් ජනතාවට බෙදා හැරීම සඳහා ලැබුණු රටඉඳි මෙට්‍රික් ටොන් 400ය දළ වශයෙන් එක් පවුල් ඒකකයකට 1Kgක් ලැබෙන සේ බෙදා හැරීම සිදු කරන ලදී.

## 3.8 මෙරටට පැමිණෙන මුස්ලිම් ජාතිකයින් සඳහා වීසා ලබාදීම

3.8.1 2017 වසරේ සිට වීසා නිකුත් කිරිම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පිළිගත් නව ක්‍රමවේදයක් හඳුන්වා දුන් අතර එම ක්‍රමවේදයට අනුව වීසා ඉල්ලීම් සිදු කරන අනුග්‍රාහකයන් (අරාබි විදුහල්, මුස්ලිම් දේවස්ථාන, සංවිධාන) සඳහා ලේකම්තුමාගේ අනුමැතිය ලබාදීම සිදු කරන ලදී.

3.8.2 2018.01.01 සිට 2018.07.31 දින දක්වා නේවාසික වීසා දිර්ඝ කිරීම් 305ක්ද ඇතුළත් වීමේ වීසා 130ක්ද නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

## 3.9 2018 ජාතික මිලාදුන් නබි සංවර්ධන වැඩසටහන

2018 වර්ෂයේ ජාතික මීලාදුන් නබි සංවර්ධන වැඩසටහන සඳහා අයවැය දෙපාර්තමේන්තුවෙන් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට රු.මිලියන 20 ක් වෙන්කර ඇත. මෙවර මිලාදුන් නබි උත්සවය මන්නාරම දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක කළ අතර එම ප්‍රතිපාදන මන්නාරම දිස්ත්‍රික්කයේ මුස්ලිම් පල්ලි, අහදියා දහම් පාසැල්, මද්සරා ඇතුලුව අලුත්වැඩියා කිරීම් 55ක් සඳහා වෙන් කරන ලදී. මෙම කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමාගේ මගපෙන්වීම සහ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු කළ අතර 2018 වසර අවසන් වන විට රු. මිලියන 19.51ක් වැය කර යෝජිත සියලුම සංවර්ධන වැඩ කටයුතු අවසන් කර ඇති අතර භෞතික ප්‍රගතිය 100%ක් වේ.

## 3.10. 2018 පල්ලි සංවර්ධන කටයුතු

2018 වර්ෂයට පල්ලි සංවර්ධන වැඩසටහන සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට වෙන්වූ රු. මිලියන 25 ක ප්‍රතිපාදන වලින් දිවයිනේ සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි මුස්ලිම් පල්ලි හා අරාබි පාසල් අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා ප්‍රතිපාදනයන් නිසියාකාර ලෙස බෙදීමට අවශ්‍ය උපදෙස් ලබාදීම හා අධීක්ෂණය කිරීම අමාත්‍යාංශ ලේකම්තුමාගේ මගපෙන්වීම සහ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු කරන ලදී. ඒ අනුව 2018 වසර අවසන් වන විට මේ යටතේ රු. මිලියන 24.28ක් වැය කර තෝරාගත් මුස්ලිම් පල්ලි හා අරාබි පාසල් අලුත්වැඩියාවන්ට අදාළ සංවර්ධන වැඩ 121ක් අවසන් කර ඇති අතර භෞතික ප්‍රගතිය 99%ක් වේ.

**3.11 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් කෙරෙන ඉල්ලීම්**

3.11.1 මුස්ලිම් බැතිමතුන්, පූජකවරුන් හා මුස්ලිම් සංවිධාන නායකයින් විසින් ගරු ජනාධිපතිතුමන්, අග්‍රාමාත්‍යතුමන් හා වෙනත් ආයතන හා දෙපාර්තමේන්තු මගින් අමාත්‍යාංශය වෙතින් කරන ලද ඉල්ලීම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයා වෙත අවශ්‍ය පියවරයන් ගැනීමට උපදෙස් ලබාදී යොමු කිරීම හා ඒ සම්බන්ධ අධීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

3.11.2 පල්ලි ඉදිකිරීම් වෙනුවෙන් සමාජ සංවිධාන වලින් මතුවන විරෝධතා පිළිබඳව ප්‍රාදේශීය පරිපාලනය හා අදාළ පොලිස් ස්ථාන සමඟ සම්බන්ධවී අවශ්‍ය පරිදි කටයුතු කර ඇත.

3.11.3 පල්ලි දායක සභා පත්කිරීම්වලදී අසාධාරණකම් හා දූෂණ ක්‍රියාවන් සිදුවී ඇතැයි ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා හා වකුෆ් සභාව සමඟ අදාළ කටයුතු සිදු කර ඇත.

**3.12 මුස්ලිම් ආගමික සංස්කෘතිය හා සම්බන්ධ විශේෂ ව්‍යාපෘති 04ක් ආරම්භ කිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක කරමින් පවතී.**

- මුස්ලිම් සමාජය තුළින් අභාවයට යමින් පවතින සාම්ප්‍රදායික / පාරම්පරික සංස්කෘතික අංග පිළිබඳව සොයා බලා ඒවා ප්‍රවර්ධනය කිරීම.
- පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත මුස්ලිම් ආගමික හෝ සංස්කෘතික ස්ථාන සොයා බලා ඒවා සංරක්ෂණය කිරීම.
- අරාබි අක්ෂර කලාව (Arabic Calligraphy) පිළිබඳ උගතුන් බිහිකිරීම සඳහා අවශ්‍ය මූලික වැඩකටයුතු ආරම්භ කිරීම.
- මෙරට මුස්ලිම් මස්ජිද සංචාර/විදේශික/බාහිර පාර්ශවයන්ට විවෘත කිරීම.

## 04 අභ්‍යන්තර විගණන කටයුතු

විගණන සැලැස්මට අනුව තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ, අභ්‍යන්තර විගණන අංශයේ 2018 වර්ෂයේ කාර්ය සාධනය මෙසේය.

**4.1. සිදුකළ විගණන විමසුම් හා පරීක්ෂණ ගණන**

(අ). තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය - 08

(ආ). මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - 05

**4.2. සිදුකළ විශේෂ විමර්ශන**

(අ). තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය - 01

(ආ). මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - 04

(ඇ). තැපැල් දෙපාර්තමේන්තුව - 05

**4.3. විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වාර හතරක් (04) පැවැත්වීම.**

**4.4. මූලික ඇගයුම් වාර්තාව පිළියෙල කිරීම.**

**4.5. 2018 වර්ෂයේ කාර්තු වාර්තා හතරක් (04) පිළියෙල කිරීම.**

## 05 මූල්‍ය කටයුතු

- **පුනරාවර්තන අරමුදල් - තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය**

2018.12.31 දිනට වෙන්කර දී ඇති පුනරාවර්තන ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම පහත දක්වා ඇති පරිදි වේ.

| වැය විෂයය | විස්තරය | 2018 මුල් ඇස්තමේන්තුවට අනුව ප්‍රතිපාදන (රු.) | 2018.සංශෝධිත ඇස්තමේන්තුව අනුව ප්‍රතිපාදන (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) |
|---|---|---|---|---|
| | **පුද්ගල පඩිනඩි** | **75,800,000** | **75,800,000** | **58,418,076** |
| 1001 | වැටුප් හා වේතන | 46,000,000 | 46,000,000 | 38,923,463 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 5,300,000 | 5,300,000 | 3,193,566 |
| 1003 | වෙනත් දීමනා | 24,500,000 | 24,500,000 | 16,301,047 |
| | **ගමන් වියදම්** | **5,000,000** | **7,982,000** | **7,885,497** |
| 1101 | දේශීය | 1,500,000 | 1,350,000 | 1,264,158 |
| 1102 | විදේශීය | 3,500,000 | 6,632,000 | 6,621,339 |
| | **නඩත්තු වියදම්** | **15,850,000** | **12,378,000** | **11,159,297** |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 3,500,000 | 3,300,000 | 3,261,896 |
| 1202 | ඉන්ධන | 11,600,000 | 8,478,000 | 7,335,866 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 750,000 | 600,000 | 561,536 |
| | **නඩත්තු වියදම්** | **9,850,000** | **8,363,000** | **7,484,122** |
| 1301 | වාහන | 8,000,000 | 7,830,000 | 6,955,617 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,350,000 | 533,000 | 528,505 |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 500,000 | 0 | 0 |
| | **සේවා** | **26,500,000** | **19,572,000** | **16,802,090** |
| 1401 | ප්‍රවාහන | 5,100,000 | 4,090,000 | 4,063,169 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 4,400,000 | 2,735,000 | 2,599,039 |
| 1403 | විදුලිය හා ජලය | 5,500,000 | 4,600,000 | 4,040,471 |
| 1404 | බදු කුලී හා පළාත් පාලන ආයතනවලට වරිපනම් බදු | 6,000,000 | 2,042,000 | 0 |
| 1409 | වෙනත් | 5,500,000 | 6,105,000 | 6,099,412 |
| | **මාරු කිරීම්** | **1,200,000** | **710,000** | **662,882** |
| 1506 | රජයේ සේවකයින් සඳහා වන ණය | 1,200,000 | 710,000 | 662,882 |
| | **වෙනත් පුනරාවර්තන වියදම්** | **100,000** | **100,000** | **97,400** |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 100,000 | 100,000 | 97,400 |
| | **එකතුව** | **134,300,000** | **124,905,000** | **102,509,364** |


- **ප්‍රාග්ධන අරමුදල් - තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය**

2018.12.31 දිනට වෙන්කර දී ඇති ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම පහත දක්වා ඇති පරිදි වේ.

| වැය විෂයය | විස්තරය | 2018 මුල් ඇස්තමේන්තුවට අනුව ප්‍රතිපාදන (රු.) | 2018.සංශෝධිත ඇස්තමේන්තුව අනුව ප්‍රතිපාදන (රු.) | 2018.12.31 දිනට වියදම (රු.) |
|---|---|---|---|---|
| | **මූලධන වත්කම් පුනුරුත්තාපනය හා වැඩි දියුණු කිරීම** | **5,550,000** | **10,585,000** | **10,530,288** |
| 2001 | ගොඩනැගිලි | 700,000 | 3,985,000 | 3,974,566 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 350,000 | 350,000 | 308,904 |
| 2003 | වාහන | 4,500,000 | 6,250,000 | 6,246,818 |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **6,150,000** | **35,480,000** | **32,495,820** |
| 2101 | වාහන | 0 | 0 | 0 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,500,000 | 5,330,000 | 4,345,066 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2,000,000 | 2,100,000 | 1,411,434 |
| 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 150,000 | 0 | 0 |
| 1-2-2-2104 | පුරාවිද්‍යාත්මක වටිනාකමින්යුත් ආගමික මධ්‍යස්ථාන නවීකරණය කිරීම | | 24,250,000 | 23,290,713 |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 1,500,000 | 2,800,000 | 2,468,795 |
| 1-2-0-2502 | වෙනත් ආයෝජන - මුද්දර හා තැපැල් සේවාව ප්‍රවර්ධනය කිරීම | 1,000,000 | 1,000,000 | 979,814 |
| | **එකතුව** | **11,700,000** | **46,065,000** | **43,026,108** |

Annexure 1

# Organizational Chart – Ministry of Postal Services and Muslim Religious Affairs



Ministry of Postal Services and Muslim Religious Affairs

**Cadre Information as at 31st Dec. 2018** **Annexure 11**

| Designation | Service | Grade/Class | Salary Code | Service Level | Approved Cadre | | | | Existing Cadre | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | Permanent | Contract | Casual | Permanent | Contract | Casual | Other |
| Secretary | | | SL-4/2016 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Addl. Secretary | SLAS | Special | SL-3/2016 | 1 | 2 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| Chief Financial Officer | SLAcS | Special | SL-3/2016 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Chief Accountant | SLAcS | 1 | SL-1/2016 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Chief Internal Auditor | SLAcS | 1 | -do- | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Senior Asst. Secretary | SLAS | 1 | -do- | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Director | SLAS | 1 | -do- | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Director | SLPS | 1 | -do- | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Assistant Director | SLPS | 11/111 | -do- | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Accountant | SLAcS | 11/111 | -do- | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Asst. Secretary | SLAS | 11/111 | -do- | 1 | 3 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| Legal Officer | Dept. | 111 | -do- | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Administrative Officer | PMAS | Supra | MN-7/2016 | 2 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Information & Communication Technology Officer | SLICTS | 11 | MN-6/2016 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Translator | TS | 1 | -do- | 2 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Co- ordinating Secretary to the Secretary | Temporary | - | Rs.36,620/- ( Monthly Allowance) | 3 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 |
| Assistant Information & Communication Technology Officer | SLICTS | 111 | MT-1/2016 | 3 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Development Officer | DOS | 111 | MN-4/2016 | 3 | 10 | 0 | 0 | 7 | 0 | 0 | 0 |
| Budget Assistant | Asso. Officer | - | -do- | 3 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Development Assistant | Asso. Officer | - | -do- | 3 | 19 | 0 | 0 | 11 | 0 | 0 | 0 |
| Supply Assistant | Asso. Officer | - | -do- | 3 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Audit Assistant | Asso. Officer | - | -do- | 3 | 5 | 0 | 0 | 3 | 0 | 0 | 0 |
| Transport Officer | SLTS | - | MN-3/2016 | 3 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Public Management Assistant | PMAS | 1/11/111 | MN-2/2016 | 3 | 22 | 0 | 0 | 18 | 0 | 0 | 0 |
| Driver | DS | 1/11/111 | PL-3/2016 | 4 | 13 | 0 | 0 | 10 | 0 | 0 | 0 |
| K.K.S. | OES | 1/11/111 | PL-1/2016 | 4 | 18 | 0 | 0 | 15 | 0 | 0 | 03 |
| Still Camera Operator | Temporary | - | Rs. 14,425/- ( Monthly Allowance) | 4 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 |
| Camera Operator | Temporary | - | -do- | 4 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 |
| Camera Operator Aide | Temporary | - | Rs. 11,730/- (Monthly Allowance) | 4 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 |
| Garden Labourer | Contract | 111 | PL-1/2016 | 4 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 |
| **Total** | | | | | **111** | **01** | **04** | **80** | **01** | **03** | **03** |

# Ministry in Action



Hon. Speaker Karu Jayasuriya, Hon. Minister and Post Master General at World Postal Day celebration - 2018




Hon. Minister meets His Excellency the Ambassador of the Kingdom of Saudi Arabia



Hon. Minister, Secretary and Post Master General participating in inauguration ceremony of online stamps purchasing service



Hon. Minister meets His Excellency the Ambassador of Palastine. Secretary of the Ministry also participated



Issuance of the stamp for the Independence Cup 2018 to celebrate 70th Independence day



Distributing dates for Ramazan - 2018

# Ministry in Action




Issuance of revenue stamps - 2018



Hon. Minister, Secretary and Director of Department of Muslim Religious and Cultural Affairs visit the development works in Mannar District



Participating in postal mobile service in Matale



Ifthar ceremony held at the Department of Muslim Religious and Cultural Affairs



Postal Service Officers receiving confirmation letters



Selection of Haj devotees - 2018